# දැන්වීමයි

## 2022/2023 අධ්‍යයන වර්ෂය (ප්‍රථම වසර සිසුන්) සඳහා ශිෂ්‍යාධාර වාරික ගෙවීම් කිරීම

## තාක්ෂණ පීඨය

2022/2023 (ප්‍රථම වසර) අධ්‍යයන වර්ෂයට අදාළව ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ලැයිස්තුව (SELECTED LIST), අපේක්ෂිත ශිෂ්‍ය ලැයිස්තුව (PENDING LIST) සහ ඔවුන්ගේ ගිණුම් විස්තර ශිෂ්‍ය සුබසාධක අංශ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර ඇත. ඊට අමතරව ප්‍රතික්ෂේපිත ශිෂ්‍ය ලැයිස්තුවද (REJECTED LIST) ශිෂ්‍ය සුබසාධක අංශ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර ඇත.

ශිෂ්‍ය සුබසාධක වෙබ් අඩවිය - **welfare.sjp.ac.lk**

ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලැබූ (SELECTED) සහ ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වය සඳහා අපේක්ෂිත (PENDING) සිසුන්ගේ නාම ලේඛන පමණක් ඔවුන්ගේ ගිණුම් විස්තර සමඟ **තාක්ෂණ පීඨ කාර්යාලයේ** තබා ඇති අතර එහි සඳහන් ගිණුම් අංක පරීක්ෂා කර එම ගිණුම් අංකවල නිවැරදිතාවය තම අත්සන යොදා තහවුරු කරන ලෙස සිසුන්ට දන්වා සිටිමි.

නාම ලේඛනයෙහි සඳහන් කර ඇති **ගිණුම් අංකයෙහි යම් නිවැරදි කිරීම් සිදු කිරීමට ඇති සිසුන් සහ තම ගිණුම් විස්තර ඉදිරිපත් නොකළ සිසුන් මහජන බැංකු පාස් පොතේ නිවැරදි ගිණුම් අංකය සහිත මුල් පිටුවේ පිටපතක තම ලියාපදිංචි අංකය, ජාතික හැඳුනුම්පත් අංකය සහ දුරකතන අංකය සඳහන් කර පීඨ කාර්යාලයට ගෙනැවිත් භාරදිය යුතුය.** (බැංකු ගිණුමක් නොමැති සිසුන් මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක බැංකු ගිණුමක් ආරම්භ කර ගිණුම් විස්තර ඉදිරිපත් කළ යුතු අතර ඔබට අයත් ගිණුමක් මේවන විටත් තිබේ නම්, නව ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය නොවේ.)

**ගිණුම් අංක ලබා නොදෙන සිසුන් සඳහා සහ අත්සන් ලේඛනයේ අත්සන් නොකරන සිසුන් සඳහා ශිෂ්‍යාධාර වාරික මුදල් ගෙවීම් කිරීම තාවකාලිකව අත්හිටුවන අතර 2024.10.18** දිනට පෙර අදාළ නාම ලේඛනයේ අත්සන් කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

ශිෂ්‍යාධාර සම්බන්ධයෙන් ඔබට කිසියම් ගැටලුවක් ඇත්නම්, කරුණාකර ඔබගේ ගැටලුව usjbursary@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ 011-2881731, 011-2803471 ඔස්සේ යොමු කරන්න.

නියෝජ්‍ය ලේඛකාධිකාරී/ ශිෂ්‍ය සුබසාධක අංශය

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශිෂ්‍ය සුභසාධක අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල - නුගේගොඩ.

# NOTICE

## Payment of Bursaries for the 1st year students (Academic year 2022/2023)

## Faculty of Technology

Bursary eligible student list, pending list and rejected list of the 1st year students (Academic year 2022/2023) have been published on the website of the student welfare division.

**Website - welfare.sjp.ac.lk**

Bank account details and other information of Bursary eligible students and students who are in the pending list have been kept **at the Technology Faculty Dean's office**. Please check your bank account details and confirm the correctness of those details by signing the given name list.

**Students those who need to correct the Bank details and students those who have not submitted Bank details should submit a copy of 1st page of the Bank passbook with Registration No, NIC No and Contact No of the student to the Dean's office on or before 18th October 2024.** (Students who do not have a bank account should open a bank account in any branch of People's Bank and submit the account details. If you already have an account, no need to open a new account.)

**Bursary payment will be temporarily suspended for students who have not provided account details and students who have not signed the name list.**

If you have any issue regarding bursaries, please send your issues to email address (usjbursary@gmail.com) or contact Student Welfare Division on 011-2881731, 011-2803471.

Deputy Registrar
Student welfare division

Deputy Registrar
Students' Welfare Division
University of Sri Jayewardenepura
Gangodawila - Nugegoda.